Australian Government
Civil Aviation Safety Authority

KNOW YOUR DRONE

# ඩ්‍රෝන ආරක්ෂාව පිළිබඳ වැදගත් තොරතුරු




ඔබගේ ඩ්‍රෝනය බිම් මට්ටමේ සිට මීටර 120 කට (අඩි 400 කට) ඉහළින් පියාසර නොකල යුතුය.




ඔබගේ ඩ්‍රෝනය අනෙක් අයගෙන් අඩු තරමින් මීටර 30 ක්වත් දුරින් තිබිය යුතුය.




ඔබගේ ඩ්‍රෝනය ග්‍රෑම් 250 ට වඩා බරින් වැඩිනම්, පාලන කුළුනක් ඇති පාලනය කරන ගුවන් තොටුපලකින් අවම වශයෙන් කිලෝමීටර 5.5 ක්වත් දුරකින් පියාසර කල යුතුය.



ඔබ හෙලිකොප්ටර ගොඩ බස්වන ස්ථානයක හෝ පාලන කුළුණක් නැති කුඩා අහස් යාත්‍රාන්ගණයක් අසල සිටීනම් කිලෝමීටර 5.5 ක් ඇතුලත ඔබගේ ඩ්‍රෝනය ඔබට පියාසර කල හැකිය. මිනිසුන් විසින් හසුරවනු ලබන ගුවන් යානයක් ඔබ අසළ තිබෙන බව දැනගතහොත්, ඔබගේ ඩ්‍රෝනය හැකි විගස ආරක්ෂාකාරී ආකාරයට එයින් ඉවතට හසුරුවා බිමට බැස්සවිය යුතුය.



ඔබගේ ඩ්‍රෝනය මිනිසුන්ට ඉහළින් හෝ ජනගහණය ඇති පෙදෙසෙක පියාසර නොකල යුතුය. මෙම ප්‍රදේශ අතරට මුහුදු වෙරළ, උද්‍යාන, ඉසව්, හෝ ක්‍රීඩාවක් සිදුවන ක්‍රීඩාංගනද ඇතුලත්වේ.



ඔබගේ ඩ්‍රෝනය ඔබට පෙනෙන තෙක්මානයේ තබාගත යුතුය. මෙයින් අදහස් වන්නේ ඔබගේ ඩ්‍රෝනය ඔබගේ ඇස්වලට පෙනෙන ආකාරයට තබා ගත යුතු බවයි (උපකරණයක්, තිරයක්, හෝ ගොගල්ස් ආධාරයෙන් නොව).



ඔබගේ ඩ්‍රෝනය මහජන ආරක්ෂාවට බලපාන හෝ හදිසි මෙහෙයුම් සිදුකරන ප්‍රදේශවලට ඉහළින් හෝ ආසන්නයේ පියාසර නොකල යුතුය. මේවා අතරට රිය අනතුරු, පොලිස් මෙහෙයුම්, ගිනි හෝ ගිනි නිවීමේ උත්සාහයන් හෝ සෙවුම් සහ බේරා ගැනීම් ඇතුලත්වේ.



ඔබගේ ඩ්‍රෝනය රාජකාරි සඳහා (වාණිජ වශයෙන්) පියාසර කිරීමට බලාපොරොත්තුවේ නම්, ඔබ විසින් පිළිපැදිය යුතු අමතර රීතීන් ඇත. ඔබගේ ඩ්‍රෝනය ලියාපදිංචි කිරීම සහ ඔබ විසින් බලපත්‍රයක් හෝ පිළිගැනීමක් ලබාගැනීම අවශ්‍යවේ.



ඔබගේ ඩ්‍රෝනය වෙනත් ගුවන් යානයකට, පුද්ගලයෙකුට හෝ දේපළවලට උපද්‍රවයක් වන ආකාරයට පියාසර නොකල යුතු බව මතක තබා ගන්න.



පුද්ගලිකත්වයට ගරු කරන්න. අනෙක් අයගේ අනුමැතිය නැතිව ඔවුන්ව වීඩියෝ කිරීම හෝ ඡායාරූප ගැනීම නොකරන්න — මෙය වෙනත් නීති උල්ලංඝනය කිරීමක් විය හැකිය.



ඔබ විසින් වරකට එක ඩ්‍රෝනයක් පමණක් පියාසර කල යුතුය.



ඔබ විසින් ඩ්‍රෝන පියාසර කල යුත්තේ දහවල් කාලයේදී පමණි, වළාකුළු ඇතිවිට හෝ මීදුම ඇතිවිට පියාසර නොකල යුතුය.

»» KNOWYOURDRONE.GOV.AU

1908.2916 (Sinhalese)